## වාණිජකරණය හමුවේ නොනැසී පවතින වැදි ජන අනන්‍යතාව

ඩබ්.ඩබ්.ආර්. කුමාරි - දේශපාලනවිද්‍යා හා රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශය

නූතන ලෝක සංදර්භය තුළ සියලු ජන කොටස් ස්වසාම්ප්‍රදායික අනන්‍යතාවන්ගෙන් වියුක්ත වෙමින් නව ජීවන රටා වෙත අනුගත වීමේ ලක්ෂණය කැපී පෙනේ. එවැනි පසුබිමක ශ්‍රී ලංකාවේ වැදි ජනයා ස්වසම්ප්‍රදාය අත් නොහරිමින් නූතනත්වය කරා ගමන් කිරීමේ ප්‍රවණතාව හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වේ. මෙහි පර්යේෂණ ගැටලුව වනුයේ වර්තමානය වන විට වැදි ප්‍රජාව නූතන ආර්ථික රටා වෙත ප්‍රවේශ වී පැවතියදීත් ඔවුන් තවදුරටත් ස්වසම්ප්‍රදාය නඩත්තු කර ගැනීමට උත්සාහ දරනුයේ ඇයි ද යන්නයි. දෘෂ්ටිවාද, අභිලාශ, උපාය සහ චර්යා යනාදි සිද්ධාන්ත අධ්‍යයනය සඳහා පශ්චාත් ප්‍රත්‍යක්ෂමූලවාදී ක්‍රමවේදයට අනුගතව ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා සහ නිරීක්ෂණ භාවිත කරනු ලැබීය. ඒ සඳහා අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස යොදා ගත් දඹාන වැදි ගම්මානය සහ පිටස්තර ප්‍රජාද නියෝජනය වන ලෙස සම්පූර්ණ දත්ත දායකයන් පහළොවක් පර්යේෂණ නියැදිය ලෙස යොදා ගන්නා ලදි. එමෙන්ම, පුවත්පත්, කෘති සහ සඟරා ඔස්සේ ද්විතීයික දත්ත ඒකරාශී කිරීම සිදු විය. ඒ අනුව, ප්‍රජා අනන්‍යතාව යන සිද්ධාන්තය ගුණාත්මක මාදිලියට සම්බන්ධ වුවද එකී දත්ත වඩාත් නිරවුල්ව හඳුනා ගැනීම සඳහා මිශ්‍ර විධික්‍රමයක් යොදා ගැනුණි. මෙකී මූලධර්ම ඔස්සේ වැදි ප්‍රජාව නූතන වාණිජ ආර්ථිකයට අනුගත වෙමින් පවතින බව අවධාරණය විය. එමෙන්ම එයට සමගාමීව සිංහල සමාජය සමග අන්තර්ග්‍රහණය වීමට උත්සාහ දැරුව ද සිංහල ජනයා, ඔවුන් තමා හා සම තත්ත්වයෙහි ලා සැලකීමට ඇති අකමැත්ත ද කැපී පෙනුණි. මෙකී පසුබිම තුළ තමා වෙනස් ප්‍රජාවක් ලෙස බැහැර කිරීම ඔස්සේ ඔවනට තව දුරටත් ස්වසාම්ප්‍රදායික අනන්‍යතාව මුදල් ඉපයීමේ උපකරණයක් බවට පත් කර ගැනීම කෙරෙහි වඩාත් සාධනීය ලෙස බලපෑම් කොට ඇති බැවු හඳුනා ගත හැකි විය. ඒ අනුව, පර්යේෂණයේ මූලික තර්කය වන්නේ, ඔවුන් තව දුරටත් ස්වසම්ප්‍රදාය නඩත්තු කිරීමට උත්සාහ දරනුයේ නූතනත්වය පිළිබඳව හෝ සාම්ප්‍රදායික අනන්‍යතාව පිළිබඳව වූ ස්වයං සවිඥානකත්වයක් මත නොව හුදෙක්ම සිය *'පැවැත්ම'* යන සාධකය මත පදනම් බව යි.

**ප්‍රමුඛ පද:** *ආදිවාසීන්, දේශපාලන ආර්ථිකය, වාර්ගික අනන්‍යතාව, නවීකරණය*